

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

வளிமண்டலவியல் திணைக்களம்

DEPARTMENT OF METEOROLOGY

2021

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த சாத்திய அறிக்கை

Annual Performance Report

කාර්ය සාධන වාර්තාව
2021

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය- 304

2021 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය- 304

අන්තර්ගතය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 5

1.1 හැඳින්වීම 5

1.2 ආයතනයේ දැක්ම,මෙහෙවර,අරමුණු 5

1.3 ප්‍රධාන කාර්යයන් 6

1.4 සංවිධාන සටහන 7

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා යටතේ පවතින ප්‍රාදේශීය කාර්යාල 8

1.5.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 8

1.5.2. දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රාදේශීය කාර්යාල 11

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් 11

1.7 විදේශ අධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 11

02 පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම 13

2.1 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අනාවැකි කරන අංශයේ ප්‍රගතිය 13

2.2 පර්යේෂණ අංශය සහ දේශගුණ විපර්යාස අධ්‍යයන කේන්ද්‍රය 14

2.3. වර්ෂාපතන, දත්ත, දේශගුණ, උපකරණ දත්ත සැකසුම් හා සංරක්ෂණ (පරිගණක) අංශ හා බාහිර කාර්යාලවල ප්‍රගතිය 16

2.3.1. දත්ත අංශයේ ප්‍රගතිය 16

2.3.2 වර්ෂාපතන අංශයේ ප්‍රගතිය 16

2.3.3. දේශගුණ අංශයේ ප්‍රගතිය 16

2.3.4. උපකරණ අංශයේ ප්‍රගතිය 17

2.3.5 බාහිර කාර්යාල වල ප්‍රගතිය 17

2.4 අභියෝග 17

2.5 ඉදිරි ඉලක්ක 19

03 පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 21

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 21

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 22

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 23

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 24

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 24

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 24

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 24

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 25

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 25

04 පරිච්ඡේදය- කාර්ය සාධන දර්ශක 26

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 26

05 පරිච්ඡේදය- තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය 27

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු 27

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් 29

5.2.1 තිරසර සංවර්ධන ඉලක්ක 29

5.2.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග 35

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 37

6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය (2021.12.31 දිනට කාර්ය මණ්ඩලය) 37

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය 37

6 .3 මානව සම්පත් සංවර්ධනය 38

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 40

ඇමුණුම 01 51

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ආරක්ෂක අමාත්‍යාංශ විෂය පථය යටතේ පවත්නා පැරණිතම ආයතනයක් වන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි මූලාරම්භය පිළිබඳව සැලකීමේදී මුලින්ම මෙරට තුල විධිමත්ව කාලගුණ විද්‍යා නිරීක්ෂණ කටයුතු සිදු කිරීම 1867 වසරේදී මිනින්දෝරු දෙපාර්තමේන්තුව යටතේ ආරම්භ විය. පසුව 1909 දී කාලගුණ විද්‍යාත්මක කටයුතු සඳහා කොළඹ නිරීක්ෂණාගාරය නමින් වෙනම අංශයක් වර්තමාන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු පරිශ්‍රය තුල පිහිටුවීම සිදු විය. කාලගුණික සහ දේශගුණික සේවා ලබාදීමේ මූලික අරමුණ ඇතිව එම කොළඹ නිරීක්ෂණාගාරය 1948 වසරේදී ස්වාධීන දෙපාර්තමේන්තුවක් බවට පත් කරන ලදි. වර්තමානය වන විට කාලගුණ විද්‍යාව සහ දේශගුණ විද්‍යාව ආශ්‍රිත සේවා සැපයීමේ රජයේ ව්‍යවස්ථාපිත ආයතනය වශයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කටයුතු කරයි. කාලගුණ ව්‍යසන සහ සුනාමි පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීම් සඳහා බලය ලත් ජාතික ආයතනය වනුයේද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවයි.

1.2 ආයතනයේ දැක්ම,මෙහෙවර,අරමුණු

දැක්ම

තිරසර ලෙස සංවර්ධිත ශ්‍රී ලංකාවක් උදෙසා කාලගුණය සහ දේශගුණය පිළිබඳ සේවාවන් සපයන ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම බුද්ධි මධ්‍යස්ථානය වශයෙන් පැවතීම.

මෙහෙවර

ජාතික ශුභ සිද්ධියට සහ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වෙමින් රාජ්‍ය ආයතන වලට, පෞද්ගලික අංශයේ ආයතන වලට සහ මහජනයාට කාලගුණ විද්‍යාව, ගුවන් කාලගුණ විද්‍යාව, සමුද්‍ර කාලගුණ විද්‍යාව, ජල කාලගුණ විද්‍යාව, කෘෂි කාලගුණ විද්‍යාව, දේශගුණ විද්‍යාව සහ සීමිත වූ තාරකා විද්‍යාව පිළිබඳ සේවාවන් සැපයීම.

අරමුණු

- විවිධ ක්ෂේත්‍ර වලට අදාළව සිදුවන බලපෑම පාදක කරගත් ස්ථානය හා වේලාව වඩා නිරවද්‍ය වූ කාලගුණ අනාවැකි සේම කාලගුණ අනතුරු ඇඟවීම් සැපයීම.
- ඍතු අනාවැකිකරණය විශේෂයෙන්ම කෘෂිකර්මාන්තයට අදාළ වන සේ නිකුත් කර එම අනාවැකි නිතිපතා යාවත්කාලීන කිරීම.
- රජයේ දිගුකාලීන සංවර්ධන කටයුතු පහසුකර ගැනීම සඳහා එම සංවර්ධන කටයුතු නිසි පරිදි සැලසුම් කර ගැනීමට අවශ්‍ය දේශගුණික අනාවැකි වඩා විශ්වාසනීය තත්ත්වයකට ගෙන ඒම.

- දෙපාර්තමේන්තුවේ සියලු යටිතල පහසුකම් අන්තර්ජාතික තත්ත්වයට ගැලපෙන පරිදි නවීකරණය කිරීම

1.3 ප්‍රධාන කාර්යයන්

- සාමාන්‍ය ජනතාවට සහ කෘෂිකර්මය, බලශක්ති, ධීවර, නාවික, රක්ෂණ, සහ අනෙකුත් අංශ සඳහා කාලගුණ විද්‍යා සහ දේශගුණික සේවා සැපයීම.
- අයහපත් කාලගුණය (සුළිසුළං, අධික වර්ෂාව, අකුණු, අධික සුළං...ආදිය ඇතුළුව) සහ සුනාමි පිළිබඳ අනතුරු ඇඟවීම් සහ උපදේශන සැපයීම.
- ගුවන් කාලගුණ සේවා සැපයීම.
- දේශගුණික දත්ත සමුදායන් නඩත්තු කිරීම.
- ජාතික සංවර්ධන සහ පර්යේෂණ අරමුණු සඳහා කාලගුණ විද්‍යා සහ දේශගුණ විද්‍යා සේවා සහ දත්ත සැපයීම.
- කාලගුණ විද්‍යාව, දේශගුණ විද්‍යාව, දේශගුණික විපර්යාස සහ ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ අධ්‍යයනය සහ පර්යේෂණ දිරිමත් කිරීම.
- කාලගුණය, දේශගුණය සහ දේශගුණික විපර්යාස තේමා ක්ෂේත්‍ර පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම සහ දායක වීම.
- පාසල් ළමුන්, ප්‍රතිපත්ති සහ තීරණ ගන්නන් ඇතුළු උනන්දුවක් දක්වන කණ්ඩායම් සඳහා අධ්‍යාපනික සහ පුහුණු වැඩසටහන් සහ වැඩමුළු, අනිවාර්ය තේමා ක්ෂේත්‍ර පිළිබඳව සංවිධානය කිරීම සහ දායක වීම.
- ප්‍රදර්ශන භාණ්ඩ සහ සම්පත් පිරිස් සමඟ ප්‍රදර්ශන සඳහා දායක වීම.
- ඉල්ලීම මත විශේෂිත කාලගුණ විද්‍යා සහ දේශගුණික සේවා සැපයීම.
- සීමිත තාරකා විද්‍යාත්මක (හිරු, චන්ද්‍ර, ග්‍රහලෝක සහ උදම්) සහ භෞමික චුම්භකත්වය සම්බන්ධ සේවා සැපයීම.

1.4 සංවිධාන ව්‍යුහය - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව



1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා යටතේ පවතින ප්‍රාදේශීය කාර්යාල

1.5.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

අනු අංකය	ප්‍රධාන අංශය	උප අංශය	වගකීම්
01	ප්‍රාදේශීය කාර්යාල සහ දේශගුණික විපර්යාස අධ්‍යයනය	දේශගුණික අංශය	කලාපීය ස්ථාන සම්බන්ධීකරණය සහ කළමනාකරණය, තත්ත්ව පාලනය සහ කාලගුණ විද්‍යා දත්ත සංරක්ෂණය කිරීම
		වර්ෂාපතන අංශය	සියලුම වර්ෂාපතන ස්ථාන සම්බන්ධීකරණය සහ අධීක්ෂණය, නව වර්ෂාපතන ස්ථාන පිහිටුවීම, වර්ෂාව මැනීමට ස්වේච්ඡා නිරීක්ෂකයින් පුහුණු කිරීම
		දත්ත අංශය	ස්වයං-වාර්තාගත කාලගුණ විද්‍යා උපකරණ වලින් දත්තවල තත්ත්ව පාලනය, සැකසීම සහ ලේඛනාගාරය
		රේඩියෝසොන්ඩ් අංශය	ඉහළ වායුගෝලීය නිරීක්ෂණ, එවැනි දත්ත සංරක්ෂණය කිරීම සහ දෙපාර්තමේන්තුවට පැමිණෙන අමුත්තන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
		කෘෂි කාලගුණ විද්‍යා අංශය	කෘෂි කාලගුණ විද්‍යා ජාලය සම්බන්ධීකරණය, සහ තත්ත්ව පාලනය සහ කෘෂි කාලගුණ දත්ත සංරක්ෂණය
		පර්යේෂණ අංශය	කාලගුණ විද්‍යාත්මක හා දේශගුණ විද්‍යාත්මක පර්යේෂණ පැවැත්වීම
		දේශගුණ අධ්‍යයන මධ්‍යස්ථානය	දේශගුණික විපර්යාස සම්බන්ධ කටයුතු සිදු කිරීම
02	ගුවන් සේවා සහ සංවර්ධනය	සැලසුම්, සංවර්ධන සහ ව්‍යාපෘති අංශය	සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම, ප්‍රගති අධීක්ෂණ සහ වාර්තා කිරීම, වාර්ෂික

			පරිපාලන සහ කාර්ය සාධන වාර්තාව, SDGs සම්බන්ධීකරණය සහ අධීක්ෂණය
		තොරතුරු තාක්ෂණ අංශය	කාලගුණ විද්‍යා දත්ත පරිගණක ආකෘතිවල තත්ත්ව පාලනය සහ සංරක්ෂණය කිරීම, දේශගුණික දත්ත ගබඩාවක් නඩත්තු කිරීම, බාහිර පාර්ශ්ව වෙත කාලගුණ දත්ත නිකුත් කිරීම, දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය පවත්වාගෙන යාම සහ නවීකරණය කිරීම
		ගුවන් තොටුපල කාලගුණ විද්‍යා කාර්යාල	ගුවන් සේවා කාලගුණ විද්‍යාව සඳහා උපකාර කිරීම සඳහා ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) සහ ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ (WMO) රෙගුලාසිවලට අනුකූලව කාලගුණ විද්‍යාත්මක දත්ත/තොරතුරු සැපයීම
		ප්‍රවාහන අංශය	වාහන නඩත්තුව හා ප්‍රවාහන කටයුතු
03	කාලගුණ අනාවැකි සහ තීරණ සහාය	ජාතික කාලගුණ විද්‍යා සහ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය	කාලගුණ දත්ත සැකසීම සහ විශ්ලේෂණය, කාලගුණ අනාවැකි සහ බෙදා හැරීම, ජාතික සුනාමි සහ කාලගුණ අනතුරු පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කිරීම
		සන්නිවේදන අංශය සහ සමුද්‍ර අනාවැකි	කාලගුණ දත්ත / නිරීක්ෂණ හුවමාරු කිරීම; කාලගුණ අනාවැකි සහ පූර්ව අනතුරු ඇඟවීම් බෙදා හැරීම
		කාලගුණ අනාවැකි සහ ආපදා කළමනාකරණය	කාලගුණ අනාවැකිය, බලපෑම් මත කාලගුණ අනාවැකිය, ආපදා කළමනාකරණය සහ අකුණු අධ්‍යයන මධ්‍යස්ථානය ජාත්‍යන්තර ආපදා ආශ්‍රිත

			ක්‍රියාකාරකම් සහ විමසුම් සඳහා සහයෝගිතාව
04	නිරීක්ෂණ ජාල සහ ඉලෙක්ට්‍රොනික	උපකරණය අංශය	සාම්ප්‍රදායික කාලගුණ විද්‍යා උපකරණ ක්‍රමාංකනය කිරීම සහ නඩත්තු කිරීම, ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා උපකරණ ක්‍රමාංකනය කිරීම සහ නඩත්තු කිරීම, බාහිර පාර්ශ්වයන්ගේ ඉල්ලීම් මත කාලගුණ විද්‍යා උපකරණ ක්‍රමාංකනය කිරීම සහ නඩත්තු කිරීම සහ වඩු වැඩ සහ තාක්ෂණික කටයුතු සහ ප්‍රදර්ශන සඳහා සහාය වීම
		විදුලි හා විද්‍යුත් නඩත්තු අංශය	විදුලි හා විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව හා නඩත්තු කිරීම,ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධතිය සහ චන්ද්‍රිකා දත්ත ලබාගැනීමේ පද්ධතිය නඩත්තු කිරීම
05	පාලන හා මූල්‍ය	ආයතන අංශය	කාර්ය මණ්ඩලය සම්බන්ධ ආයතනික කටයුතු
		මූල්‍ය අංශය	මූල්‍ය කටයුතු
		ප්‍රසම්පාදන අංශය	ප්‍රසම්පාදන, ගබඩා කිරීම්, බෙදාහැරීම්
		පුහුණු අංශය	දෙපාර්තමේන්තු විභාග පුහුණු කිරීම සහ පැවැත්වීම
		ප්‍රවාහන අංශය	වාහන නඩත්තුව හා ප්‍රවාහන කටයුතු
		ගබඩා	ගබඩා කිරීම සහ හැසිරවීම ද්‍රව්‍ය, කොටස් වාර්තා නඩත්තු කිරීම
		සාමන්‍ය	සාමන්‍ය පරිපාලනය
06	අභ්‍යන්තර විගණන	අභ්‍යන්තර විගණන	අභ්‍යන්තර විගණන සැලැස්ම, අභ්‍යන්තර විගණන සහ විගණන විමසුම්

1.5.2. දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රාදේශීය කාර්යාල

කටුනායක, මත්තල, රත්මලාන, යාපනය, අනුරාධපුරය, බදුල්ල, බණ්ඩාරවෙල, මඩකලපුව, හම්බන්තොට, කටුගස්තොට, කුරුණෑගල, මහඉලුප්පල්ලම, මන්නාරම, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, පොතුවිල්, පුත්තලම, රත්නපුර, ත්‍රිකුණාමලය, ගාල්ල, වවුනියාව,මුලතිව්.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

මහ භාණ්ඩාගාරයේ ගිණුමෙන් ලැබෙන මුදලින් නඩත්තු වේ.අරමුදල් නොමැත.

1.7 විදේශ අධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

වෙනත් රාජ්‍යයන් / සංවර්ධන පාර්ශවකරුවන් හා වෙනත් විදේශ ආයතන වෙතින්

2021 වර්ෂයේ විදේශ ප්‍රදාන පිළිබඳ විස්තර

විදේශ ප්‍රදාන ලබාදුන් රට හෝ ආයතනය	විදේශ ප්‍රදාන ගිවිසුම් අංකය	විස්තරය (ප්‍රදානය ලබාදුන් හේතුව)	මුදල්, භාණ්ඩ හෝ සෘජු ගෙවීමක්ද යනවග	විදේශ ප්‍රදාන වටිනාකම		ව්‍යාපෘති කාල සීමාව
				රුපියල්	විදේශ මුදල්	
WFP	WFP-CSV-2021	දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් සඳහා LINUX සහ PHOTOSHOP /ILLUSTRATOR පිළිබඳ පුහුණුව	මුදල්	435,000.00		වසරක්
		භාහිර කාර්යාල මගින් නිරීක්ෂණය කරන කාලගුණ දත්ත කොළඹ කාර්යාලයට අන්තර්ජාල හරහා වඩා කාර්යක්ෂමව ලබා ගැනීම සඳහා අවශ්‍ය පරිගණක ඇතුළු අනෙකුත් උපාංග video conferencing kit ලබා දෙන ලදී	සෘජු ගෙවීමක්	8,262,180.00		

	WFP/LMCS	WEB GIS වෙබ් අඩවිය සහ දුරකථන (Mobile APP) දෘඩාංගය ස්ථාපිත කිරීමට අවශ්‍ය වූ firewall subscription FG -200F සඳහා	සෘජු ගෙවීමක්	3,640,614.00		වසරක්
		තද වැසි පිළිබඳ අනතුරු ඇගවීම ඇතුළු අනාවැකි කරණය වැඩි දියුණු කිරීම සඳහා වියළි කලාපය තුල ස්වයංක්‍රිය වර්ෂාමාන 20 ස්ථාපිත කර දෙන ලදී	සෘජු ගෙවීමක්	19,347,660.00		
UNDP	GCF-CRIWMP	WEB GIS වෙබ් අඩවිය සහ දුරකථන (Mobile APP) දෘඩාංගය ස්ථාපිත කිරීමට අවශ්‍ය වූ server ලබා දෙන ලදී	සෘජු ගෙවීමක්	1,824,300.00		වසරක්

- ECMWF – European Center for Medium Range Weather Forecasting
- UNDP - එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
- DOM - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
- World Bank - ලෝක බැංකුව
- GCF – Green Climate Fund
- AWS - ස්වයංක්‍රිය කාලගුණ දත්ත පද්ධති GIS – Geo Information System
- CRIP-Climate Resilience Improvement Project

02 පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ,ජයග්‍රහන,අභියෝග හා ඉදිරි ඉලක්ක

2.1 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අනාවැකි කරන අංශයේ ප්‍රගතිය

I. සුළි කුණාටු පිළිබඳ කල් වෙලා ඇතිව දැනුම් දීමෙන් විශේෂයෙන් ධීවර ජනතාවගේ ජීවිත හානිය අවම කිරීමට හැකි විය

2021 වසරේ කාලගුණික ස්වාභාවික උපද්‍රව, දැඩි සුළං, අධික වර්ෂාපතනය, හා අකුණු පිලිබඳ අනාවැකි, පූර්ව අනතුරු ඇඟවීම්, අවවාදාත්මක නිවේදන / අනතුරු ඇඟවීම් නිසි ලෙස නිකුත් කිරීමට හැකිවිය. මේ සඳහා මධ්‍යම පරාස කාලගුණ අනාවැකි සඳහා යුරෝපීය මධ්‍යස්ථානයේ (ECMWF) ගණිතමය ආකෘති දත්ත, ECMWF විශේෂ නිෂ්පාදනයක් (Products) වන ආන්තික වර්ෂාපතන දර්ශකය (Extreme Precipitation Index), ආන්තික තද සුළං දර්ශකය (Extreme wind gust Index), කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ගණිතමය අනාවැකි කරන අංශය මගින් නිපදවන WRF ගණිතමය ආකෘතියේ දත්ත, අනෙතුන් ගෝලීය ගණිතමය ආකෘති වල දත්ත, වර්ෂාපතනයේ තීව්‍රතාවය පිළිබඳ ස්වයංක්‍රීය වර්ෂාමාන වල තථ්‍ය කාලීන දත්ත තොරතුරු ඉවහල් විය. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් සාමාන්‍ය ජනතාවට, ආපදා කළමනාකරණ බලධාරීන්ට සහ ධීවර දෙපාර්තමේන්තුවට නිසි කලට නිකුත් කල පූර්ව අනතුරු ඇඟවීම් මගින් ජීවිත හානි අවම කිරීම මෙන්ම පෙර සුදානම නිසි ලෙස සිදුකිරීමට හැකි වීම මගින් ආපදා හානිය අවම කිරීමට හැකි විය.

II. ඍතුමය සහ දිගුකාලීන අනාවැකි රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශ්වකරුවන් (කෘෂිකර්මයට සහ ජල කළමනාකරණයට අදාල) පලදායි ආකාරයෙන් ඉදිරිපත් කිරීමට හැකිවීම

- භාෂා ත්‍රිත්වයෙන් මාසිකව දේශගුණ අනාවැකි නිකුත් කිරීමට කටයුතු කරන ලදී.
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP -CRIWMP) යටතේ දිස්ත්‍රික්ක වල අදාල පාර්ශවකරුවන් සමග කාලගුණ තත්වය පිළිබඳ මාසිකව අන්තර්ජාලය හරහා සාකච්ඡා කිරීම ආරම්භ කිරීමෙන් වඩා පලදායි සේවාවක් ලබාදීම ආරම්භ කරන ලදී. එහි සාර්ථකත්වය හේතුවෙන් එය සතිපතා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමෙන් දැනට එම සාකච්ඡාව සතිදෙකකට වරක් සවිස්තරව රූපමය ආකාරයෙන් ඉදිරිපත් කරයි.
- මෝසම් කතිකාවතේ පාර්ශවකරුවන්ගේ ‘ඉදිරි දින කිහිපය සඳහා සවිස්තරව කාලගුණ අනාවැකි” වලට තිබූ ඉල්ලීම අනුව දිනපතා මෙම රූපමය ආකාරයෙන් අනාවැකි ප්‍රධාන පාර්ශවකරුවන් වෙත යැවීම සිදු කරන ලදී. ඒ මගින් ඉදිරි දින වල කාලගුණ තත්ත්වය පිළිබඳ අදහසක් ගැනීමට සහ අවශ්‍ය ඉදිරි ක්‍රියා (ආපදා සඳහා පෙර සුදානමක් සහ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියා) මාර්ග ගැනීමට පිටිවහලක් විය. දැනට මෙම

අනාවැකි වැඩි දියුණු කරමින් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මගින් මහජනතාව වෙත ලබා දෙයි.

III. මහජනතාවට මෙන්ම අවශ්‍ය පාර්ශ්වකරුවන්ට (ස්ථානියව (area specific) සහ තත්‍ය කාලයෙන් (real time) දත්ත ලබාගැනීමට) වඩා පලදායි ආකාරයෙන් කාලගුණ සහ දේශගුණ තොරතුරු ලබා දීමට WEB GIS වෙබ් අඩවිය සහ දුරකථන (Mobile APP) දෘඩාංගය ස්ථාපිත කිරීමේ කටයුතු අවසන් අදියර දක්වා නිම කර ඇත.

IV. දේශගුණ පුවත් (විද්‍යුත්) සඟරාව ආරම්භ කරන ලද අතර එය මාස 4 කට වරක් නිකුත් කරන ලදී.

V. දීර්ඝ කාලයක සිට පැවති අවශ්‍යතාවයක් වූ ගණිතමය ආකෘති වැඩි දියුණු කිරීමට, පර්යේෂණ සහ කාලගුණ දත්ත පරිශීලනය සඳහා අවශ්‍ය පරිගණක සාක්ෂරතාවය ඉහල නැංවීමට අවශ්‍ය දැනුම වැඩිකරලීම සඳහා අදාල නිලධාරීන්ට LINUX /R/PHOTOSHOP/ILLUSTRATER පිළිබඳ පුහුණු ලබාදෙන ලදී.

VI. කාලගුණ අනාවැකි සහ අනතුරු ඇගවීමේ ක්‍රියාවලිය සඳහා වඩා වැදගත් වූ ස්වයංක්‍රිය වර්ෂාමාන 20 ක් නිරීක්ෂණ ජාලයේ අවම නියෝජනයක් පැවති වියළි කලාපය තුල ලෝක අහාර වැඩ සටහනේ අනුග්‍රහය යටතේ ස්ථාපිත කිරීමට හැකිවිය.

VII. කාලගුණ අනාවැකි සහ අනතුරු ඇගවීමේ ක්‍රියාවලිය සඳහා වඩා වැදගත් වූ ස්වයංක්‍රිය වර්ෂාමාන 2 ක් මන්නාරම දිස්ත්‍රික්කය තුල USAID අනුග්‍රහය යටතේ ස්ථාපිත කිරීමට හැකිවිය.

2.2 පර්යේෂණ අංශය සහ දේශගුණ විපර්යාස අධ්‍යයන කේන්ද්‍රය

2021 වර්ෂයේ පහත සඳහන් ක්ෂේත්‍රයන් ඔස්සේ පර්යේෂණ කටයුතු සිදු කිරීම

- ලංකාවේ නියග තත්ව නිරීක්ෂණය වැඩි දියුණු කිරීම සහ නියගය අනාවැකිකරණය ආරම්භ කිරීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලය හා එක්ව පර්යේෂණ ආරම්භ කිරීම.
- (Mild, weak, moderate) මෘදු, මධ්‍යම සහ දුර්වල El Nino සහ La Nina තත්ත්ව වලදී ලංකාවේ වර්ෂාපතන රටාවේ වෙනස් වීම් අධ්‍යනය.
- ගෝලීය දේශගුණික මොඩලයන්, මගින් ලබාදෙන ලද ත්‍රෛමාසික නිරීක්ෂිත වර්ෂාපතන හා සංසඳනය කරමින් , ශ්‍රී ලංකාවට එහි ඇති වලංගු භාවය පරීක්ෂා කිරීම.
- අර්ධ, දිගුකාලින අනාවකිකරණය ඒකාබද්ධ කිරීම තුලින් දේශගුණික සේවාව වැඩි දියුණු කිරීම: සිද්ධි අධ්‍යනය 2021 නිරිතදිග මෝසම.
- 2021 සැප්තැම්බර 1 වෙනි දින වාර්තාවූ කෙටි කාලීන තද වැසි තත්වයට හේතුවූ කාලගුණ සංසිද්ධි පිළිබඳ පර්යේෂණය.

පර්යේෂණ ප්‍රකාශන

- Center For Science and Technology of the Non- Aligned and Other developing Countries (NAM S&T Center) ඡ'නලය සඳහා 2021 සැප්තැම්බර 1 වෙනි දින වාර්තාවූ කෙටි කාලීන තද වැසි තත්වයට හේතුවූ කාලගුණ සංසිද්ධි පිළිබඳ පර්යේෂණ පත්‍රිකාවක් ලබාදීම.
- 2016 මැයි 15 ලංකාවට ඇතිවූ ගංවතුර සහ නායයාමට හේතුවූ ROANU සුළි කුණාටුව පිළිබඳ International Symposium on Multi Hazard Early Warning and Disaster Risk Reduction සඳහා පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.
- පර්යේෂණ සහ සංවර්ධන අංශය සහ දේශගුණ විපර්යාස අධ්‍යන කේන්ද්‍රය මගින් සිදු කරනු ලබන නිත්‍ය රාජකාරී.

නියං තත්ත්වය නිරීක්ෂණ

- නියං තත්ත්වය නිරීක්ෂණ පත්‍රිකාව - Standardized Precipitation Index භාවිතයෙන් නියං තත්ත්ව නිරීක්ෂණය සහ සිතියම් ගත කිරීම. මාසික වර්ෂාපතන දත්ත භාවිතයෙන් පිළිවෙලින් මාස 1,2,3,4,5,6,9 සහ12 යන කාල රාමු සඳහා නියං තත්ත්ව නිරීක්ෂණය කර එම කාල රාමු සඳහා නියං තත්තව සිතියම් ගත කිරීම.
- ලංකාවේ නියග තත්ව නිරීක්ෂණය වැඩි දියුණු කිරීම සහ නියගය අනාවැකිකරණය ආරම්භ කිරීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලය හා එක්ව පර්යේෂණ ආරම්භ කිරීම.

දිගු කාලීන අනාවැකි ආශ්‍රිත ක්‍රියාකාරකම්

- CPT, FOCUS, CLICK මෘදුකාංගසහ ගෝලීය දේශගුණ ආකෘති සිතියම් භාවිතයෙන් මාසික සහ ත්‍රෛමාසික වර්ෂාපතන හා උෂ්ණත්ව අනාවැකි නිර්මාණය.
- කාලගුණික මධ්‍යස්ථානයන්හි නිරීක්ෂිත කාලගුණික දත්ත භාවිතයෙන් මාසික වර්ෂාපතන අනාවැකි සත්‍යාපනය කිරීම.
- දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලයේ (IPCC) හි දේශීය කේන්ද්‍රය ලෙස දේශගුණ විපර්යාස පිළිබඳ කටයුතු දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුමේ 4 වන වගන්තියේ, 12 වන ඡේදයට අනුව, පාර්ශවයන් විසින් සන්නිවේදනය කරන ලද NDCs ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම.

2.3. වර්ෂාපතන, දත්ත, දේශගුණ, උපකරණ දත්ත සැකසුම් හා සංරක්ෂණ (පරිගණක) අංශ හා බාහිර කාර්යාලවල ප්‍රගතිය

2.3.1. දත්ත අංශයේ ප්‍රගතිය

- අඛන්ඩව දත්ත සටහන් කෙරෙන උපකරණවල (උෂ්ණත්වමාන ප්‍රස්ථාර ආර්ද්‍රතාමාන ප්‍රස්ථාර වර්ෂාපතන ප්‍රස්ථාර පිඩන ප්‍රස්ථාර හා සූර්ය දිප්ත කාඩපත් වල) දත්ත තත්ත්ව පාලනය හා සංරක්ෂණය.
- කාලගුණ විද්‍යා කාර්යාල 23 ක සුළඟේ වේගය හා දිශාව මාසිකව ගණනය කිරීම,කාලගුණ විද්‍යා කාර්යාල 10 ක සූර්ය දිප්ත පැය ගණන පරීක්ෂා කිරීම හා සංරක්ෂණය.
- බාහිර පාර්ශවයන් සඳහා දත්ත අලවියෙන් රු.75,003.00ක ආදායමක් 2021 වසරෙදි ලබා ඇත.
- කාලගුණ විද්‍යා කාර්යාල 23 මගින් ලබාදෙන දත්ත (දෛනික /මාසික), වර්ෂාපත, උෂ්ණත්ව (උපරිම/අවම), ආර්ද්‍රතාව (දිවා/රාත්‍රී), සුළඟේ වේගය,වලාකුල් ප්‍රමාණය,හිගිරුම් වාර්තාවූ දිනාගනන පරිඝණක ගත කර ඇත.
- වර්ෂාමාන ස්ථාන 430 ක දත්ත (දෛනික /මාසික) පරගණක ගත කර ඇත.
- බාහිර පාර්ශවයන් සඳහා දත්ත නිකුත් කිරීම.
    - නිකුත් කර ඇති වාර්තා ගණන - 937
    - ලබා ඇති ආදායම - රු. 6,445,694.97

2.3.2 වර්ෂාපතන අංශයේ ප්‍රගතිය

- වර්ෂාපතන දත්ත ලබාගැනීම සඳහා දිවයින පුරා ස්ථාපනය කර ඇති වර්ෂාමාන ජාලය මධ්‍යස්ථාන 520 කින් සමන්විත වන අතර ඉන් මධ්‍යස්ථාන 440 කට වැඩි සංඛ්‍යාවකින් වසර පුරාම දත්ත ලබා ගනී. මෙම මධ්‍යස්ථාන රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන හා ස්වේච්ඡා නිරීක්ෂකයන්ගේ සහයෝගය ඇතිව පවත්වාගෙන යනු ලැබේ.
- වර්ෂාමාපක මධ්‍යස්ථාන 04 ක් නැවත සක්‍රීය කෙරේ.

2.3.3. දේශගුණ අංශයේ ප්‍රගතිය

- සූර්යයා හා චන්ද්‍රයා උදාවීම,බැසීම හා පහන් දැල්වෙන වේලාව තීරණය කිරීම,ශ්‍රී ලංකාවේ එක් එක් ස්ථානවලට සූර්යයා මුදුන්වීම තාරකාවන්ගේ දෘශ්‍යතාවය, නව සඳු දැකීම,සඳුගේ කලාවන් ග්‍රහණයන් , රාමසාන් උදාවීම හා නිමාවීම පිළිබඳ තත්ත්වයන් ගණනය කිරීම,මෙන්ම අදාල ආයතන වෙත තොරතුරු ලබාදීම මෙම අංශයේ ප්‍රධාන වශයෙන් සිදුකළ කාර්යන් වේ.
- පොහොය හා රජයේ නිවාඩු දින කමිටුවේ සමාජිකයකු ලෙස ද මෙම අංශයේ සහය ලබා දෙයි.
- මෙම අංශයෙන් දත්ත බාහිර පුද්ගලයන් වෙත ලබා දීමන් රු.844,000.00ක් අදායමක් ලබා ඇත.

2.3.4. උපකරණ අංශයේ ප්‍රගතිය

- රාජ්‍ය ආයතන හා අර්ධ රාජ්‍ය ආයතන 05 ක් සඳහා ටෙන්ඩර් ලේඛන, තාක්ෂණික වාර්තා, B.O.Q. හා තාක්ෂණික පිරිවිතර සකස් කිරීම පිළිබඳ උපෙද්ශන සේවා ලබා දී ඇත.
- දෙපාර්තමේන්තුවේ ඉලෙක්ට්‍රොනික් හා තොරතුරු තාක්ෂණය පදනම් වූ උපකරණ හා පද්ධති, විදුලි සහ පරිගණක අලුත්වැඩියා කාර්යයන් 495 ක් සිදු කිරීම.
- දෙපාර්තමේන්තුවේ පරිගණක ජාලය, GTS ජාලය සහ විදුලි පද්ධතිය අඛණ්ඩ සේවාව තහවුරු වන පරිදි නඩත්තු කිරීම.
- දෙපාර්තමේන්තුවේ බාහිර පරීශ්‍රය සඳහා නව විදුලි බෙදාහැරීම් පද්ධතියක් ස්ථාපනය කිරීම.
- NWP අංශයේ පරිගණක ජාලය ස්ථාපනය කිරීම.
- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ඇති කරගත් ගිවිසුම අනුව AWS මධ්‍යස්ථාන අලුත්වැඩියා කිරීම සඳහා Data Logger 8ක් අලුත්වැඩියා කොට තත්ත්ව පරීක්ෂා කිරීම.
- සර්වර් කාමරයේ විදුලි පද්ධතිය ප්‍රතිසංවිධානය කිරීම.
- වායු සමන යන්ත්‍ර නඩත්තු කටයුතු අධීක්ෂණය කිරීම.

2.3.5 බාහිර කාර්යාල වල ප්‍රගතිය

- ද්වි පුද්ගල කාර්යාල 8ක් හා සිව් පුද්ගල කාර්යාල 09ක් ද වේ.ඉහල වායු නිරීක්ෂණ කාර්යාල තුනක් පංච පුද්ගල කාර්යාල ලෙස ක්‍රියා කරයි.ගගන කාලගුණ විද්‍යා කාර්යාල 3 ක් පවති. 2021 වර්ෂය තුල කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතුව තිබූ භූතල නිරීක්ෂන මධ්‍යස්ථාන ජාලය ඔස්සේ වර්ෂාපතනය,පීඩනය උෂ්ණත්වය.ආර්ධතාවය සුළඟ,දෘශ්‍යතාවය,වලාකුළු වර්ග හා ප්‍රමාණ ඇතුළුව භූතල නිරීක්ෂණ 60370 ක් සිදුකර ඇත.
- මෙම වසරේදී මහා ඉල්ලුප්පලම කාර්යාලයේ වහලේ සිවිලිම දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මගින් ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් අලුත් වැඩියා කරවා ගන්නා ලදී.
- බණ්ඩාරවෙල කාර්යාලයේ දීර්ඝ කාලයක් තිස්සේ පවතී ජල ගැටලුවට විසඳුමක් ලෙස ජාතික ජල සම්පාදන මණ්ඩලයෙන් නව ජල සැපයුමක් ලබා ගන්නා ලදී. පොලොන්නරුව කාර්යාලයේ තිබූ ලීටර් 5000 ජල ටැංකි 2 ජල ගැටළු පවතින මහඉල්ලුපල්ලම සහ බණ්ඩාරවෙල කාර්යාල වෙත ප්‍රවාහනය කරන ලදී.

2.4 අභියෝග

- මෙම 2021 වසරේ ඉලක්ක සපුරා ගැනීම සඳහා කොවිඩ් 19 සැලකියයුතු බාධවක් විය.
- අදාල සුදුසුකම් ලත් නිලධාරීන් ප්‍රමාණවත් අයුරින් නොසිටීම විශාල අභියෝගයකි.

- කාලගුණ විද්‍යාව යනු දිනපතා යාවත්කාලීන වන කාලගුණික ක්‍රියාවලීන් සහ පුරෝකථනය කෙරෙහි අවධානය යොමු කරන වායුගෝලය පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයයි.එම සිදුවීම් පෘථිවි වායුගෝලයේ පවතින විචල්‍යයන්ගෙන් බැඳී ඇත.ඒවා නම් උෂ්ණත්වය, පීඩනය, ජල වාෂ්ප සහ එක් එක් විචල්‍යයේ ප්‍රමිතීන් සහ අන්තර්ක්‍රියා සහ ඒවා කාලයත් සමඟ වෙනස් වන ආකාරයයි.
- පෘථිවියේ නිරීක්ෂණය කරන ලද කාලගුණ සංසිද්ධීන් වලින් වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තේ නිවර්තන කලාපයේ වන අතර බොහෝ ඒවා ඉතා ඉක්මනින් වෙනස් වන සුළුය. මෙම කාලගුණ පද්ධතීන් පිළිබඳ නිවැරදිව අනාවැකි පැවසීම මෙම නිවර්තන කලාපයේ රට වලට පවතින ප්‍රධාන අභියෝගයකි. ශ්‍රී ලංකාව ද නිවර්තන කලාපය තුල පිහිටීම හේතුවෙන් කාලගුණ සහ දේශගුණ අනාවැකිකරණය සාපේක්ෂව මධ්‍යම දේශාංශ වල පිහිටි රටවලට වඩා සංකීර්ණ වන අතර අභියෝගාත්මක කාර්යයකි.
- සාපේක්ෂව කාලගුණ විද්‍යාව දියුණු රටවල ප්‍රධාන සන්ධිස්ථානය ලෙස දක්නට ඇත්තේ පරිගණක ආකෘති එනම් සංඛ්‍යාත්මක කාලගුණ අනාවැකි පිළිබඳ වැඩි අවධානය සහ ඒ පිළිබඳ ආයෝජනය වැඩි කිරීමෙනි. මේ විෂය සම්බන්ධයෙන් දැනට දියුණු සංවර්ධිත රටවල පවතින තාක්ෂනය දෙසට ලඟා වීමට ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට දිගු ගමනක් යා යුතුව ඇත. ප්‍රමාණවත් තරම් සුදුසුකම් සහිත මානව සම්පත් නොමැතිවීමද තවත් දෙපාර්තමේන්තුව අභිමුව ඇති අභියෝගයකි. කාලගුණ අනාවැකි කරනයට අත්‍යවශ්‍ය සාධකය වන වායුගෝලීය නිරීක්ෂණ ජාලය ශක්තිමත් කිරීමද වඩාත් නිවැරදිව පුරෝකථනය කිරීමට අත්‍යවශ්‍ය කාරණයකි. පවත්නා දේශගුණික විපර්යාස නිසා කාලගුණ දේශගුණ අනාවැකි කීම වඩ වඩාත් අපහසු වෙමින් යන පසුබිමක අදාල නව අධ්‍යයන/ පර්යේෂණ කටයුතු කිරීමද අනිවාර්යය වේ.
- ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම නිසා සිදු වන දේශගුණ විපර්යාස මිනිසා ගේ පැවැත්මට ඇති ප්‍රධාන අභියෝගය ලෙස මේ වන විට හඳුනාගෙන තිබේ. දේශගුණ ක්‍රියාවලිය සංකීර්ණ, එකිනෙක සමග අන්තර් ක්‍රියා කරන, එකිනෙක සමග සම්බන්ධතාවක් ඇති, වායුගෝලය, ගොඩබිම, අයිස් හා හිම, සාගර හා අනෙකුත් ජල පද්ධතිවලින් සමන්විත වූවක් වන අතර එම දේශගුණ පද්ධති සඳහා අවශ්‍ය ශක්තිය සූර්ය විකිරණ මගින් ලබා දේ. දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍යය මණ්ඩලය (Inter-Governmental Panel on Climate Change - IPCC) විසින් නිකුත් කරන ලද නවතම වාර්තාවලට අනුව ආන්තික කාලගුණික තත්වයන් එනම් අධික උණුසුම් තත්වයන්, ආන්තික වර්ෂාපතනයන් මගින් ඇති වන ක්ෂණික ජල ගැලීම්, නාය යෑම් සහ දිගුකාලීන නියං තත්ත්වයන් වල වාරගණන, තීව්‍රතාවය, කාලපරාස වල වැඩිවීමක් පසුගිය දශක කිහිපය තුල අත්දැක ඇති අතර අනාගතදීද මෙවැනි තත්ත්ව වල වර්ධනයේ ඉහළ යාම අපේක්ෂා කෙරෙන අතර මෙමගින් දිගුකාලීන බලපාන සමාජ ආර්ථික හානි ඇතිවිය හැක. ශ්‍රී ලංකාව දේශගුණ විපර්යාස නිසා ඇති වන අහිතකර බලපෑම්වලට මුහුණ දීමට හැකි වන පරිදි

රට තුළ දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අනිවාර්යයෙන් සිදු කළ යුතු ව ඇත. දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍යය මණ්ඩලයේ දේශීය කේන්ද්‍රය වන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් දේශගුණ විපර්යාස වල බලපෑම සහ දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීම සඳහා ගෝලීය දේශගුණික ආකෘති වල දේශගුණ විපර්යාස පුරෝකථන දත්ත ප්‍රාදේශීයව සවිස්තරාත්මක ලෙස අවපරිමණනය කිරීම , දේශගුණ විපර්යාස බලපෑම් පිලිබඳ පර්යේෂණ කිරීම, පර්යේෂණ සඳහා අවශ්‍ය දත්ත සැපයීම, දේශගුණ විපර්යාස පිළිබඳ නවතම සොයා ගැනීම් පිලිබඳ දැනුමින් සවිබල ගැන්වීම සිදු කරණු ලැබේ.

- සමාජ ආර්ථික සහාග මාර්ග සෙනාරිය (Shared Socioeconomic Pathways (SSPs) scenarios) යටතේ ගෝලීය දේශගුණික මොඩලයන්හි දේශගුණික පුරෝකථන දත්තයන් ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය මට්ටමින් සවිස්තරාත්මක අවපරිමනගත කිරීම
- දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය මගින් හඳුන්වාදී ඇති නව සමාජ ආර්ථික සහාග මාර්ග සෙනාරිය (Shared Socioeconomic Pathways (SSPs) scenarios) යටතේ ගෝලීය දේශගුණික මොඩලයන්හි දේශගුණික පුරෝකථන දත්තයන් ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය මට්ටමින් සවිස්තරාත්මක අවපරිමානගත කිරීම සහ ඒවා විශ්ලේෂනය කරමින් දේශගුණික සංවේදී ක්ෂේත්‍ර සඳහා අනාගතයේ අනතුරට භාජනය වීමේ හැකියාව පිළිබඳ ඇගයීම් සකස් කිරීම, පුරෝකථන දත්ත දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ හැකියාව අධ්‍යනය.

2.5 ඉදිරි ඉලක්ක

- **දත්ත සන්නිවේදන ජාලය නවීකරණය කිරීම**

  දිවයින පුරා විසිරි පවතින ප්‍රාදේශීය විද්‍යා කාලගුණ කාර්යාල මගින් පැය 3 න් 3ට නිරීක්ෂණය කරන කාලගුණ දත්ත දැනට කොළඹ කාලගුණ විද්‍යා කාර්යාලයට ලබා ගනු ලබන්නේ දුරකතන හරහාය. පසුව මෙම දත්ත පරිගණක ගත කරනු ලබන්නේ ද අතිනි. එබැවින් මේ සඳහා අධික පිරිවැයක් සහ කාලය මෙන්ම මිනිස් ශ්‍රමයද වැයවේ. මෙම දත්ත ලොව පුරා සංනිවේදනය වන අතර ඉතා වැදගත් වේ. මෙම දත්ත කාර්යක්ෂම ලබා ගැනීමට සහ සංරක්ෂණය ඉතා අත්‍යවශ්‍ය කාර්යයකි. මේ සඳහා අන්තර් ජාලය හරහා දත්ත සන්නිවේදන ජාලයක් සැකසීමට අවශ්‍ය පරිගණක සහ අනෙකුත් උපාංග ලෝක අහාර වැඩ සටහන (WFP) අනුග්‍රහයෙන් ලබා දෙන ලදී. පරිගණක උපාංග වලට අකුණු වලින් සිදු වන හානිය අවම කර දත්ත සංනිවේදනය අඛන්ඩව සිදු කිරීම සඳහා අකුණු ආරක්ෂණ උපකරණ මිලදී ගැනීම් සඳහා අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී.

- **කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නවීකරණය කිරීම**

  කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නවීකරනය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව අයත් අමාත්‍යයංශය යටතේ "' දේශගුණික තත්වයන්ට ඔරොත්තු දීමේ බහු-අදියර ක්‍රමලේඛ ප්‍රවේශය""(CresMPA) ව්‍යාපෘතිය යටතේ නියමිතව පවතී. මෙමගින් කාලගුණ විද්‍යා නිරීක්ෂණ ජාලය වැඩිදියුණු කිරීම, අදාල මානව සම්පත් වැඩි දියුණු කිරීම, මෙන්ම අනාවැකි කරනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය තාක්ෂණික උපාංග සහ යටිතල පහසුකම් ලබා දීම ප්‍රධාන අරමුණ වේ. පළමු අධියර ලෙස ලෝක බැංකුව සමග ගිවිසුම් ගතව ඇත. 2026 වසර අවසන් වන විට ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.

- **පුත්තලම හා පොතුවිල් රේඩාර් පද්ධති ස්ථාපිත කිරීම**

  ජපාන රජයේ ආධාර මත දෙපාර්තමේන්තුවට ඩොප්ලර් රේඩාර් පද්ධති දෙකක් ප්‍රධානය කිරීමට JICA ආයතනය කටයුතු කරමින් පවතී. මෙමගින් තද වැසි සහ තද සුළං පිළිබඳ නිරවද්‍ය තාවය ඉහල අනතුරු ඇගවීමක් කිරීමේ හැකියාව ලැබේ. නමුත් පවතී වසංගත තත්වය යටතේ ව්‍යාපෘතිය ප්‍රමාද වීම නිසා ජපන් අදර යටතේ වෙන් කල මුදල ඩොප්ලර් රේඩාර් දෙකක් සඳහා ප්‍රමාණවත් නොවන බව පෙන්නුම් කරි. ඒ පිලිබඳව JICA ආයතනය සමග සාකච්ඡා ආරම්භ කර ඇත.

- දේශගුණික විපර්යාස සහ විචලනය, දේශගුණික සංවේදී ක්ෂේත්‍ර එනම් කෘෂිකර්මන්තය, ජල කළමනාකරණය, ආපදා කළමනාකරණය, බලශක්ති සහ සෞඛ්‍ය ක්ෂේත්‍ර වල ක්‍රියකාරකම් කෙරෙහි දැඩි පීඩනයක් ඇති කරන බැවින් දේශගුණික තොරතුරු භාවිතා කරමින් දේශගුණික විපර්යාස සහ විචලනය හේතුවන් ඇතිවන අවබලපෑම් අවම කිරීම පිළිබඳ දැඩි අවධානයක් යොමුවී ඇත. දේශගුණික සේවාව නවීකරණය කරමින් දේශගුණික සංවේදී ක්ෂේත්‍ර සඳහා තීරණ ගැනීමට පහසු අයුරින් දේශගුණික සේවාව වැඩි දියුණු කිරීම, දේශගුණික විපර්යාස සහ විචලනය හේතුවන් ඇතිවන අභියෝග ජයගෙන තිරසාර සංවර්ධන ඉලක්ක කරා ලඟාවීමට අත්‍යාවශ්‍ය වේ.

අධ්‍යක්ෂ ජනරාල්

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

A.K. Karunanayake
Director General
Department of Meteorology
383, Bauddhaloka Mawatha,
Colombo 07.

03 පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය



ඒසිජ්-එන්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		කත්‍ය 2021 රු.	කත්‍ය නැවත ඔලපන ලද 2020 රු.
	ආදායම් ලැබීම්		
	බදු නොවන ආදායම් හා වෙනත්	-	-
	මුළු ආදායම් ලැබීම් (අ)	-	-
	ආදායම් නොවන ලැබීම්		
	භාණ්ඩාගාර අග්‍රිම	320,884,000.00	307,508,525.00
	තැන්පතු	1,066,950.00	841,911.62
	අත්තිකාරම් ගිණුම්	8,956,153.10	9,956,153.10
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්	-	-
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)	**330,907,103.10**	**318,306,589.72**
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)	**330,907,103.10**	**318,306,589.72**
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)	3,707.97	45.11
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)	**330,903,395.13**	**318,306,544.61**
	අඩුකළා : වියදම්		
	පුනරාවර්තන වියදම්		
262,200,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	255,164,416.27	247,734,165.21
56,500,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	55,082,669.67	49,371,278.63
24,700,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	22,456,658.64	11,847,408.78
343,400,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**	**332,703,744.58**	**308,952,852.62**
	මූලධන වියදම්		
10,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	390,440.00	8,628,459.79
23,700,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	8,589,797.72	21,203,481.94
6,000,000	හැකියා වර්ධනය	514,599.04	627,192.40
12,000,000	වෙනත් මූලධන වියදම්	-	325,553.20
51,700,000	**මුළු මූලධන වියදම් (උ)**	**9,494,836.76**	**30,784,687.33**
	තැන්පතු ගෙවීම්	1,510,006.99	4,699,382.37
	අත්තිකාරම් ගෙවීම්	8,092,248.80	3,947,289.00
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්	-	-
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)	**9,602,255.79**	**8,646,671.37**
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)	**351,800,837.13**	**348,384,211.32**
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)	**(20,897,442.00)**	**(30,077,666.71)**
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය	**(20,897,442.00)**	**(30,077,666.71)**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය	-	-
395,100,000		**(20,897,442.00)**	**(30,077,666.71)**

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පි

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	නෝට්ටු	2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ		3,880,946,331.37	3,872,356,533.65
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්		22,854,213.21	23,718,117.51
මුදල් හා මුදල් සමාන දෑ		-	-
මුළු වත්කම්		**3,903,800,544.58**	**3,896,074,651.16**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		22,016,163.37	22,437,010.68
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,880,946,331.37	3,872,356,533.65
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්		838,049.84	1,281,106.83
අග්‍රිම ශේෂය		-	-
මුළු වගකීම්		**3,903,800,544.58**	**3,896,074,651.16**

පිටු අංක 6 සිට 25 දක්වා ඒසිඒ 2 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ සටහන් පිටු අංක 26 සිට 31 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙලිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් කොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචනය සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම : ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී
එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
තනතුර : ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා ආපදා
කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
දිනය : 2022.02. 23

.....
ගණන්දීමේ නිලධාරී
නම : ඒ.කේ.කරුණානායක
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2022.02. 22
ඒ.කේ. කරුණානායක
අධ්‍යක්ෂ ජනරාල්
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
383, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

.....
~~ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන~~ ගණකාධිකාරී/
~~අධ්‍යක්ෂ (මුදල්)~~/ ~~කොමිසාරිස් (මුදල්)~~
නම : ඩී.ඒ.එම්.එල්.තෙන්නකෝන්
දිනය : 2022.02. 22
අමිලා තෙන්නකෝන්
ගණකාධිකාරී
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ 07.

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්

2

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2020 රු.	තත්‍ය නැවත ගලපන ලද 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	21,628,039.03	20,703,444.29
අග්‍රිම ලැබීම්	320,884,000.00	307,508,525.00
අත්තිකාරම් අයකර ගැනීම්	8,956,153.10	9,956,153.10
තැන්පතු ලැබීම්	1,066,950.00	841,911.62
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**352,535,142.13**	**339,010,034.01**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	310,911,710.98	298,646,243.72
සහනාධාර සහ මාරුකිරීම්	22,456,658.64	11,847,408.78
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	1,507,681.33	1,544,095.00
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	3,707.97	45.11
අත්තිකාරම් ගෙවීම්	7,555,578.50	4,100,933.00
තැන්පතු ගෙවීම්	1,510,006.99	4,699,382.37
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**343,945,344.41**	**320,838,107.98**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**8,589,797.72**	**18,171,926.03**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	8,589,797.72	18,171,926.03
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	8,589,797.72	18,171,926.03
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(8,589,797.72)	(18,171,926.03)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

				රු.	
ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාල නොවේ	-	-	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

				රු.
ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණය % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	326,400,000.00	343,400,000.00	332,703,744.58	97%
ප්‍රාග්ධන	51,700,000.00	51,700,000.00	9,494,836.76	19%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

						රු.
අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
අදාල නොවේ	-	-	-	-	-	-

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

					රු.
වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2021** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2021** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	278,325,000.00	278,325,000.00	-	-
9152	යන්ත්‍රෝපකරණ	322,084,168.67	322,084,168.67	-	-
9153	ඉඩම්	3,280,037,227.70	3,280,037,227.70	-	-
9154	අස්පෘෂ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්තාව අවසානයේ ඇමුණුමක් (ඇමුණුම 01) ලෙස අමුණා ඇත.

04 පරිච්ඡේදය- කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	75%-89%	50%-74%
1. ආපදා අවදානම අවම කිරීම සඳහා පූර්ව අනතුරු ඇඟවීම් නිසිකලට නිකුත් කිරීම	95%		
2. නිරීක්ෂණ ජාල වැඩි දියුණු කිරීම	95%		
3. මහජන කාලගුණ /දේශගුණ පිළිබඳ සේවාව ඉහළ නැංවීම	95%		
4. අනාවැකිකරණ වල නිරවද්‍යතාවය ඉහළ දැමීම	95%		

05 පරිච්ඡේදය- තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75%- 100%
13. දේශගුණික විපර්යාස සහ එහි බලපෑමට එරෙහිව සටන් කිරීමට කඩිනම් පියවර ගැනීම	13.1 සියලුම රටවල කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වභාවික ආපදාවලට ඔරොත්තු දීමේ සහ එවැනි තත්වයන්ට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම. 13.1.a වඩාත් විශ්වාසදායක කාලගුණ සහ දේශගුණික තොරතුරු, අනාවැකි සහ අයහපත් කාලගුණ අනතුරු ඇඟවීම් සැපයීම 13.1.b බලපෑම මත පදනම් වූ අනාවැකි ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම 13.1.c අනාවැකි මත පදනම් වූ ක්‍රියා	13.1.1 ආපදා හේතුවෙන් සිදුවන මරණ අනුපාතය	* 20%		
		13.1.2 ස්වභාවික විපත් හේතුවෙන් අභ්‍යන්තරව අවතැන් වූවන්, අතුරුදහන් වූවන් සහ පීඩාවට පත් වූ මුළු සංඛ්‍යාව			
	13.2 ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ක්‍රමෝපායන් සහ සැලසුම්වලට කාලගුණ වෙනස්කම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් කිරීම 13.2.a ජාතික ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ සැලසුම් සඳහා අනාගත දේශගුණ ප්‍රක්ෂේපණ (දර්ශන/නිරීක්ෂණ) තොරතුරු සැපයීම	13.2.1 අනාගත දේශගුණික විපර්යාස ප්‍රක්ෂේපන මත පදනම්ව සකස් කර ඇති ජාතික ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ සැලසුම් ගණන 13.2.2 සකස් කරන ලද ප්‍රක්ෂේපණ ගණන	* 20%		

	13.2.b සෘතුමය අනාවැකි සැපයීම 13.2.c අසීමාන්තික අනාවැකි (Seamless forecast) සැපයීම				
	13.3 කාලගුණ වෙනස්වීම අවම කිරීම, ඒ අනුව හැඩගැසීම, බලපෑම අවම කිරීම සහ පූර්ව අනතුරු සම්බන්ධයෙන් අධ්‍යාපනය, දැනුවත්භාවය ඉහළ නැංවීම සහ මානව සහ ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීම 13.3.a දේශගුණික විපර්යාස බලපෑම්, අවම කිරීම් සහ අනුවර්තනයන් පිළිබඳ දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම 13.3.b කාලගුණය, දේශගුණය සහ දේශගුණික විපර්යාස පිළිබඳ නිලධාරීන්ගේ ධාරිතාව වැඩි දියුණු කිරීම 13.3.c උපද්‍රවයන් හඳුනා ගැනීම 13.3.d උපද්‍රව සිතියම්ගත කිරීම	13.3.1 දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන 13.3.2 ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් ගණන	* 20%		
	13.B අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ කුඩා දිවයින් වල පිහිටි සංවර්ධනය වෙමින් පවතින රටවල කාන්තාවන්, තරුණයින් සහ දේශීය හා ආන්තීකරණයට ලක්වූ ප්‍රජාවන් ද	13.B.1 සහභාගී වූ රැස්වීම් ගණන	* 20%		

	ඉලක්ක කරගනිමින් කාලගුණික වෙනස් වීම් සඳහා ඵලදායී සැලසුම් සකස් කිරීමට හා කළමනාකරණය කිරීම සඳහා ධාරිතාවන් වැඩිදියුණු කිරීමේ යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම. 13.B.a ජාතික අනුවර්තන සැලැස්ම සකස් කිරීමට සම්බන්ධ වීම 13.B.b ජාතික වශයෙන් නිර්ණය කර ඇති දායකත්වයන් සැකසීමට සම්බන්ධ වීම 13.B.c විවිධ තත්වයන් යටතේ අනාගත දේශගුණික විපර්යාස ප්‍රක්ෂේපණ සකස් කිරීම සංවර්ධනය කිරීම	13.B.2 දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන			
		13.B.3 සකස් කරන ලද ප්‍රක්ෂේපණ ගණන			

*කොරෝනා වසංගත තත්ත්වය සමග බැඳුනු අනෙකුත් හේතූන් හා 2021 වසරේ රටේ පැවති තත්ත්වය නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමක් සිදු නොවීය. එබැවින් ජයග්‍රහණ වල ප්‍රගතිය වැඩිදියුණු වීමක් දක්නට නැත.

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින්

5.2.1 තිරසර සංවර්ධන ඉලක්ක

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කටයුතු වලට සෘජුව සම්බන්ධ වන තිරසාර සංවර්ධන ඉලක්කය වන්නේ 13 වන ඉලක්කයයි. එනම් 'දේශගුණික විපර්යාස සහ එහි බලපෑම් වලට එරෙහිව සටන් කිරීමට හදිසි පියවර ගැනීම' යි. දේශගුණික විපර්යාස සහ එහි බලපෑම් වලට එරෙහිව සටන් කිරීමට කාලගුණ විද්‍යාව දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු කාර්යභාරයන් බොහෝ ය. එම ඉලක්ක සඳහා කාලගුණ විද්‍යාත්මක දායකත්වය වර්ගීකරණය කිරීමෙන් පසු වායු දූෂණය, දේශගුණික තොරතුරු, දේශගුණික විපර්යාස සහ කාලගුණ අනාවැකි ලෙස කොටස් හතරක් අර්ථ දක්වා ඇත. මෙයට අමතරව තවත් ඉලක්ක 11 ක් සඳහා දෙපාර්තමේන්තුව වක්‍රාකාරයෙන් සම්බන්ධ වේ. (ඉලක්ක 1, 2, 3, 5, 6, 7, 9, 11, 14, 15, 17). 13 වන ඉලක්කය හා එයට අදාලව දෙපාර්තමේන්තුව සඳහා සැකසූ අරමුණු, ඉලක්ක හා දර්ශක පහත පරිදි වේ.

ඉලක්කය 13: දේශගුණික විපර්යාස සහ එහි බලපෑම් වලට එරෙහිව සටන් කිරීමට හදිසි පියවර ගැනීම

තීරණ ගන්නන්ට දේශගුණික විපර්යාස බලපෑම් වලට අනුවර්තනය වීමට සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ අවශ්‍යතාවයන් සඳහා විද්‍යාත්මක කරුණු හා විශ්ලේෂණයන් ලබා දීම සිදු කරයි. දේශගුණික විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුමට සහාය දැක්වීමට සහ "ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන්" අනුව විමෝචන අවම කිරීමේ ක්‍රියාමාර්ගයන්ට මග පෙන්වීමට අවශ්‍ය දත්ත, පුරෝකථනයන් සහ පර්යේෂණ කටයුතු සඳහා සහයෝගය ලබා දෙන අතර කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ලංකාවේ "දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය(IPCC)" නාභීය ලක්ෂ්‍යය (Focal point) ලෙස කටයුතු කරයි.

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	පාර්ශවකරුවන්
13. දේශගුණික විපර්යාස සහ එහි බලපෑමට එරෙහිව සටන් කිරීමට කඩිනම් පියවර ගැනීම	13.1 සියලුම රටවල කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වභාවික ආපදාවලට ඔරොත්තු දීමේ සහ එවැනි තත්වයන්ට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම. 13.1.a වඩාත් විශ්වාසදායක කාලගුණ සහ දේශගුණික තොරතුරු, අනාවැකි සහ අයහපත් කාලගුණ අනතුරු ඇඟවීම් සැපයීම 13.1.b බලපෑම මත පදනම් වූ අනාවැකි ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම 13.1.c අනාවැකි මත පදනම් වූ ක්‍රියා	13.1.1 ආපදා හේතුවෙන් සිදුවන මරණ අනුපාතය 13.1.2 ස්වභාවික විපත් හේතුවෙන් අභ්‍යන්තරව අවතැන් වූවන්, අතුරුදහන් වූවන් සහ පීඩාවට පත් වූ මුළු සංඛ්‍යාව	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සෞඛ්‍ය අමාත්‍යාංශය ජාතික ආරක්ෂාව සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

	13.2 ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ක්‍රමෝපායන් සහ සැලසුම්වලට කාලගුණ වෙනස්කම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් කිරීම 13.2.a ජාතික ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ සැලසුම් සඳහා අනාගත දේශගුණ ප්‍රක්ෂේපණ (දර්ශන/නිරීක්ෂණ) තොරතුරු සැපයීම 13.2.b සෘතුමය අනාවැකි සැපයීම 13.2.c අසීමාන්තික අනාවැකි (Seamless forecast) සැපයීම	13.2.1 අනාගත දේශගුණික විපර්යාස ප්‍රක්ෂේපන මත පදනම්ව සකස් කර ඇති ජාතික ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ සැලසුම් ගණන 13.2.2 සකස් කරන ලද ප්‍රක්ෂේපණ ගණන	පරිසර අමාත්‍යාංශය ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ජාතික ආරක්ෂාව සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
	13.3 කාලගුණ වෙනස්වීම අවම කිරීම, ඒ අනුව හැඩගැසීම, බලපෑම අවම කිරීම සහ පූර්ව අනතුරු සම්බන්ධයෙන් අධ්‍යාපනය, දැනුවත්භාවය ඉහළ නැංවීම සහ මානව සහ ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීම 13.3.a දේශගුණික විපර්යාස බලපෑම්,	13.3.1 දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන 13.3.2 ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් ගණන	දේශගුණික විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

	අවම කිරීම් සහ අනුවර්තනයන් පිළිබඳ දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම 13.3.b කාලගුණය, දේශගුණය සහ දේශගුණික විපර්යාස පිළිබඳ නිලධාරීන්ගේ ධාරිතාව වැඩි දියුණු කිරීම 13.3.c උපද්‍රවයන් හඳුනා ගැනීම 13.3.d උපද්‍රව සිතියම්ගත කිරීම		
	13.B අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ කුඩා දිවයින් වල පිහිටි සංවර්ධනය වෙමින් පවතින රටවල කාන්තාවන්, තරුණයින් සහ දේශීය හා ආන්තීකරණයට ලක්වූ ප්‍රජාවන් ද ඉලක්ක කරගනිමින් කාලගුණික වෙනස් වීම් සඳහා ඵලදායී සැලසුම් සකස් කිරීමට හා කළමනාකරණය කිරීම සඳහා ධාරිතාවන් වැඩිදියුණු කිරීමේ යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම.	13.B.1 සහභාගී වූ රැස්වීම් ගණන 13.B.2 දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන 13.B.3 සකස් කරන ලද ප්‍රක්ෂේපණ ගණන	දේශගුණික විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

	13.B.a ජාතික අනුවර්තන සැලැස්ම සකස් කිරීමට සම්බන්ධ වීම 13.B.b ජාතික වශයෙන් නිර්ණය කර ඇති දායකත්වයන් සැකසීමට සම්බන්ධ වීම 13.B.c විවිධ තත්වයන් යටතේ අනාගත දේශගුණික විපර්යාස ප්‍රක්ෂේපණ සකස් කිරීම සංවර්ධනය කිරීම		

ඉලක්කය 1: දුප්පත්කම අවසන් කිරීම

ආපදා අවදානම අවම කිරීම, පර්යේෂණ ඉදිරියට ගෙනයාම සහ තීරණ ගැනීම සඳහා තොරතුරු හා සේවා සැපයීම පිළිබඳ සියලු කටයුතු පාහේ සංවර්ධනයට සහ දුප්පත්කම තුරන් කිරීමට දායක වේ. දරිද්‍රතාවය අවම කිරීමේ පියවර ලෙස සැමවිටම හඳුනා නොගත්තද, කාලගුණය, දේශගුණය ආශ්‍රිත අනෙකුත් නිෂ්පාදන හා සේවාවන් අත්‍යවශ්‍ය හා බොහෝ විට මැනිය හැකි සමාජ-ආර්ථික ප්‍රතිලාභ ලබා දෙයි.

ඉලක්කය 2: කුසගින්න තුරන් කිරීම, ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය වැඩි දියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම

ගොවීන්, සහ ධීවරයින් අවදානම් අඩු කිරීම, බෝග අනුගත කිරීම, එදිනෙදා හා ඍතුමය ගොවිජන කළමනාකරණය ඵලදායිතාව උපරිම කිරීම සඳහා කාලගුණ හා දේශගුණික සේවාවන් මත පුළුල් ලෙස රඳා සිටිති. කෘෂිකාර්මික අංශයට ඔවුන් වැඩි වැඩියෙන් ඉලක්ක කර ඇති සේවාවන් තුළින් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා ජාතික කාලගුණ විද්‍යා විද්‍යාත්මක සේවාවන් පැහැදිලිවම කේන්ද්‍රීය වේ. උදාහරණයක් ලෙස කාලගුණය, දේශගුණය සහ ගොවීන් පිළිබඳ රෝවිං සම්මන්ත්‍රණ ගොවීන්ට ඔවුන්ගේ මෙහෙයුම් තීරණ වලට ලබා ගත හැකි හොඳම කාලගුණය සහ දේශගුණික තොරතුරු යෙදවීමට සහාය වේ.

ඉලක්කය 3: නිරෝගී ජීවිත සහතික කිරීම සහ සෑම වයස් කාණ්ඩයකම යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම

ගංවතුර, නියඟ, උනුසුම්තාවය,සුළිසුළං සහ වායු දූෂණය හේතුවෙන් මරණ හා දේපළ හානි සිදුවෙයි. ජාතික කාලගුණ විද්‍යා සේවාව වෙනත් සේවා සපයන්නන්ට සෞඛ්‍ය ආයතනවලට සහ මහජනතාවට ලබා දෙන පුරෝකථනයන් සහ උපදෙස් මෙම ජීවිත බේරා ගැනීමට ඉවහල් වේ. බොහෝ රෝග බෝ

කරන මදුරුවන්, කිනිතුල්ලන් සහ වෙනත් කෘමීන්ගේ පැවැත්ම සහ වර්ධනය කාලගුණය, දේශගුණය සහ ජලය යන සාධක මත නිරන්තරයෙන් බලපායි.

ඉලක්කය 5: ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සියලුම කාන්තාවන් සවිබල ගැන්වීම

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීමට සහ ගැහැණු ළමයින් හා කාන්තාවන් සවිබල ගැන්වීමට අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී. උසස් වීමේදී හෝ පුහුණු පාඨමාලා සඳහා තෝරා ගැනීමේදී කාන්තා සහ පිරිමි සියලු දෙනාටම සමව සලකයි. දේශගුණික විපර්යාස, ආපදා අවදානම අවම කිරීම සහ තිරසාර සංවර්ධනය යන අභියෝගයන්ට මුහුණ දීම ද සඳහා ඔවුන්ගේ හැකියාවන්, ශක්තිය සහ කුසලතා ඔප් නැංවීම සඳහා අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී.

ඉලක්කය 6: සැමට ජලය සහ සනීපාරක්ෂාව ලබා ගත හැකි සහ තිරසාර ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම

සෘතුමය, මාසික වැනි දිගු කාලීන අනාවැකි සැපයීමෙන් සහ දත්ත විශ්ලේෂණයන් සැපයීම මගින් පානීය ජලය සුරක්ෂිත බව සහතික කිරීමට උපකාරී වේ. ජාතික කාලගුණ විද්‍යා තොරතුරු ජාලය මගින් සපයනු ලබන වර්ෂාපතනය ඇතුලු අනෙක් නිරීක්ෂණ හා පර්යේෂණ තිරසාර ජල කළමනාකරණයට මග පෙන්වීම සඳහා අත්‍යවශ්‍ය වේ.

ඉලක්කය 7: සැමට දැරිය හැකි, විශ්වාසදායක, තිරසාර හා නවීන බලශක්තිය සඳහා ප්‍රවේශය සහතික කිරීම

පිරිසිදු බලශක්ති ප්‍රභවයන් විසින් වෙළඳපල කොටසෙහි වර්ධනයට පහසුකම් සපයන්නේ වර්ෂාපතනය, හිරු එළිය සහ සුළං දත්ත සහ පුරෝකථනයන් මගිනි. කාලගුණ සහ දේශගුණ අනාවැකි ජල යටිතල පහසුකම් සහ බලශක්ති යටිතල පහසුකම් ආරක්ෂා කිරීමට උපකාරී වේ.

ඉලක්කය 9: ඔරොත්තු දෙන යටිතල පහසුකම් ගොඩනැගීම, සියල්ල ඇතුළත් සහ තිරසාර කාර්මිකකරණය ප්‍රවර්ධනය කිරීම සහ නව්‍යකරණයන් පෝෂණය කිරීම

දැඩි කාලගුණය නිසා අවදානමට ලක්විය හැකි යටිතල පහසුකම් වලට හානි කිරීමට හෝ විනාශ කිරීමට හැකි වන අතර එමඟින් ආර්ථික හා මානව පාඩු සිදුවිය හැකිය. ජාතික කාලගුණ වාර්තා සහ අනාවැකි, යටිතල පහසුකම් සහ කර්මාන්ත ස්වාභාවික උපද්‍රව වලින් ආරක්ෂා කරන අතර දේශගුණික විපර්යාසයන් වෙරළබඩ හා අනෙකුත් දේශගුණික අවදානමට ලක්විය හැකි ප්‍රදේශවල යටිතල පහසුකම් ස්ථානගත කිරීම සහ දේශගුණය පිළිබඳ මග පෙන්වීමක් සපයයි.

ඉලක්කය 11: නගර සහ මානව ජනාවාස සියල්ල ඇතුළත්, ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ තිරසාර

කාලගුණික හා දේශගුණික තත්ත්වයන්ට වඩාත් හොඳින් ඔරොත්තු දීමට නගර සැලසුම්කරුවන්ට උදව් කිරීමෙන්, කාලගුණය සහ දේශගුණික උපද්‍රව වලින් සිදුවන මරණ හා දේපල හානිය අවම කිරීම,

අවදානමට ලක් වූවන් සවිබල ගැන්වීම ආරක්ෂා කිරීමට බහු උපද්‍රව සහිත පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති (Multi Hazard Early Warning System) සහ බලපෑම් මත පදනම් වූ අනතුරු ඇඟවීම් (Impact Based Forecasts) හඳුන්වා දීම මගින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව දායකත්වය දක්වයි.

ඉලක්කය 14: තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සමුද්‍ර සම්පත් සංරක්ෂණය හා තිරසාර ලෙස භාවිතා කිරීම

ලංකාව කුඩා දූපත් මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල් අතරට ලා සැලකෙන අතර නිරන්තර කාලගුණික දේශගුණික වෙනස්කම් වලට තෝතැන්නක් වූ අවදානමට ලක්විය හැකි විශාල ඉන්දියන් සාගර යෙන් වටවූ රටක් මෙන්ම ලංකාවේ ජාතික ආර්ථිකයට සාගර, මුහුදු සහ සමුද්‍ර සම්පත් සැලකියයුතු මට්ටමකින් දායකත්වය දරයි. සාගර දිගින් දිගටම උණුසුම් වන අතර මුහුදු මට්ටම ඉහළ යන්ම සාගර සඳහා නිරීක්ෂණ, පර්යේෂණ හා මෙහෙයුම් සේවාවන්හි අවශ්‍යතාවය සඳහා පර්යේෂණ සඳහා දත්ත සහ අවශ්‍ය අනාවැකි ලබාදීම ජාතික කාලගුණ විද්‍යාත්මක සේවාව ලෙස තිබෙන අවම සම්පත් උපරිම ලෙස භවිතා කරමින් සහාය ලබාදේ.විශේෂයෙන් වෙරළබඩ ජලයෙන් යටවීමේ ගංගා ආශ්‍රිත ලවන තාවය වැඩිවීම වැනි දේවල් අවම කිරීමට මෙන්ම ඒවායින් වන හානිය වලක්වා ගැනීමට අවශ්‍ය තොරතුරු සහ පර්යේෂණ සඳහා අවශ්‍ය සහය ලබාදේ.

ඉලක්කය 15: භූමි පරිසර පද්ධතිවල තිරසාර භාවිතය ආරක්ෂා කිරීම, සහ ප්‍රවර්ධනය කිරීම, වනාන්තර තිරසාරව කළමනාකරණය කිරීම, කාන්තාරීකරණයට එරෙහිව සටන් කිරීම සහ ඉඩම් හායනය වැළැක්වීම සහ ආපසු හැරවීම සහ ජෛව විවිධත්ව හානිය නැවැත්වීම

නියඟය හා ගංවතුරෙන් හානියට පත් ඉඩම් ඇතුළුව, කාන්තාරීකරණයට එරෙහිව සටන් කිරීමට සහ පිරිහුණු ඉඩම් හා පස යථා තත්ත්වයට පත් කිරීමට ගන්නා උත්සාහයන්ට සහාය වන අත්‍යවශ්‍ය දත්ත සහ පුරෝකථනයන් සපයයි. ක්‍රියාශීලී හා ඒකාබද්ධ ජාතික නියඟ කළමනාකරණ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සඳහා රජයන්ට සහාය වීම සඳහා සහයෝගයෙන් කටයුතු කරයි.

ඉලක්කය 17: ක්‍රියාත්මක කිරීමේ මාධ්‍යයන් ශක්තිමත් කිරීම සහ තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය හවුල්කාරිත්වය පුනර්ජීවනය කිරීම

කාලගුණය, දේශගුණය සහ ජල සේවා සැපයීම සඳහා වූ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජාතික කාලගුණ විද්‍යා හා ජල විද්‍යාත්මක සේවාවන්හි හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ධාරිතා සංවර්ධනය ශක්තිමත් කිරීමයි. SDGs, ආපදා අවදානම් අවම කිරීම සඳහා සෙන්ඩායි රාමුව, 2015-2030, අනෙකුත් පාර්ශවකරුවන්ගේ හවුල්කරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.

5.2.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග

මෙම ඉලක්ක කරා යාමේදී වඩා විශ්වාසදායක කාලගුණ සහ දේශගුණ අනාවැකි සහ තොරතුරු සැපයීම අත්‍යවශ්‍ය කාරණයකි.

මේ සඳහා සමකය ආසන්න කුඩා දිවයිනක් මෙන්ම නැගෙනහිරින් විසල් ඉන්දියන් සාගරය සේම බටහිරින් අරාබි මුහුදින් වටවී ඇති ශ්‍රී ලංකාවේ කාලගුණ සහ දේශගුණ අනාවැකි කීමම අභියෝගයකි. එලෙසම අදාල සුදුසුකම් සහිත ප්‍රමාණවත් තරම් මානව සම්පත් හිඟයක් පැවතීම අනෙක් ප්‍රධාන අභියෝගය වේ. අවශ්‍ය තාක්ෂණික දැනුම විශේෂයෙන්ම ගණිතමය අනාවැකිකරණය වැඩිදියුණු කිරීම, නිලධාරීන්ට අවශ්‍ය දැනුම ලබාදීම සහ අවශ්‍ය යටිතල පහසුකම් සහ ප්‍රමාණවත් තරමේ කාලගුණ දත්ත ලබා ගැනීමේ ජාලයක් සහ යථාවත් වූ සුපිරි පරිසණක පහසුකම් නොමැති වීමද අභියෝගයකි.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය (2021.12.31 දිනට කාර්ය මණ්ඩලය)

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	54	39	15
තෘතියික	29	03	26
ද්විතීයික	238	198	40
ප්‍රාථමික	139	115	24

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

ආයතනයේ මානව සම්පත් හිඟය දැඩි ලෙස කාර්ය සාධනයට බලපා ඇත. තාක්ෂණික නිලධාරීන්ගේ හිඟය වසර කිහිපයක සිට පවතී. මෙම තාක්ෂණික නිලධාරීන් අතරින් ද්විතීයික මට්ටමට අයත් කාලගුණ විද්‍යා නිරීක්ෂක/සන්නිවේදක නිලධාරීන් බඳවා ගනු ලබනුයේ තරඟ විභාගයකින් වන අතර සාමාන්‍යයෙන් වසර 02 ක පුහුණුවකින් පසු ප්‍රාදේශීය කාර්යාල වල සේවය සඳහා යොදා ගැනේ. 2021 වර්ෂයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක/සන්නිවේදක (පුහුණු ශ්‍රේණිය) සඳහා පුහුණුලාභීන් 27 දෙනෙකු බඳවා ගනු ලැබූ අතර වසර 02 ක පුහුණුව අවසන් වූ පසු ප්‍රාදේශීය කාර්යාල වල සේවය සඳහා යෙදවීමට නියමිත වුවත් පවතින දැඩි නිලධාරී හිඟය හේතුවෙන් වසර 02 යාමට මත්තෙන්ම ඔවුන් බාහිර කාර්යාල වලට යැවීමට සිදුව ඇත. ප්‍රාදේශීය කාර්යාල සඳහා ස්ථාන භාර නිලධාරී ලෙස ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් යෙදිය යුතු වුවද නිලධාරී හිඟය මත කනිෂ්ට නිලධාරීන් ද ස්ථාන භාර නිලධාරීන් ලෙස යෙදවීමට සිදුව ඇත. එමනිසා මෙම සේවාව තත්ත්වාකාරයෙන් පවත්වා ගැනීම ද අභියෝගයකි.

දෙපාර්තමේන්තුවේ කොඳුනාරටිය ලෙස සලකන කාලගුණ විද්‍යාඥයින් ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම ද කාර්ය සාධනයට බලපෑම් ඇති කරයි. සේවා අවශ්‍යතාවයක් වන කාලගුණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ලබා ගැනීම සඳහා මෙරට තුළ හැකියාවක් නොමැති බැවින් කාලගුණ විද්‍යාඥයින් විදේශ ගත යුතු වන්නේය. එලෙස වසර 02 කට පමණ ඔවුන් විදේශ ගත වීමේදී එම පුරප්පාඩුව පිරවීම ද තරමක් ගැටලුවකි. ඇතිවෙමින් පවත්නා දේශගුණ වෙනස්වීම් හේතුවෙන් කාලගුණ සහ දේශගුණ තොරතුරු පිළිබඳ ඉමහත් ඉල්ලුමක් ඇතිවෙමින් පවතී. කෘෂිකාර්මික සහ ජල කළමණාකරණ කටයුතු සඳහා මෙම

තොරතුරු සේවාදායකයනට අවශ්‍ය ආකාරයෙන් සැකසීමට සුදුසුකම් ලද නිලධාරීන් අත්‍යාවශ්‍ය සාධකයකි. සංවර්ධන, සංචාරක, බලශක්ති, ප්‍රවාහන, ගුවන්, නාවික කටයුතු සේම සෞඛ්‍ය වැනි සේවාවන් සඳහා ද අවශ්‍ය අනාවැකි සහ තොරතුරු සැපයීමට ද සැලකිය යුතු පිරිසක් අවශ්‍ය වේ. කාර්යාල සහායක හිඟය ද පවතී. ආයතනයේ පරිපාලන සහ මූල්‍ය අංශ සඳහාද ප්‍රමාණවත් නිලධාරීන් නොමැති වීම හේතුවෙන් ඉතා අපහසුවෙන් රාජකාරි ඉටු කරමින් පවතී.

6 .3 මානව සම්පත් සංවර්ධනය

වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ මාර්ග ගත පුහුණු පාඨමාලාව	04	දින 2යි	රු.30,000		දේශීය	කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම ලබා දීම
Formal Letter Writing Skills පුහුණු වැඩසටහන	01	දින 1යි	රු. 5,000		දේශීය	රාජකාරී ලිපි ලිවීම පිලිබඳ මූලික දැනුම ලබා දීම
කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ මාර්ග ගත පුහුණු පාඨමාලාව	01	දින 2යි	රු. 10,000		දේශීය	කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම ලබා දීම
පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම	11	දින 1යි	රු. 55,000		දේශීය	පෞද්ගලික ලිපිගොනුව ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම

						පිලිබඳ මූලික දැනුම ලබා දීම
තොරතුරු තාක්ෂණ නොවන නිලධාරීන් සඳහා අත්‍යවශ්‍ය තොරතුරු තාක්ෂණ කුසලතා	04	දින 2යි	රු. 14,000		දේශීය	අත්‍යවශ්‍ය තොරතුරු තාක්ෂණ කුසලතා පිළිබඳ දැනුම ලබා දීම
රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම	13	දින 1යි	රු. 65,000		දේශීය	රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිලිබඳ දැනුම ලබා දීම

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1. පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ				
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	-		
1.6	වෙනත්	-		
2. පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)				
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.3	විගණන විමසුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛණය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3. මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභීනියෝජනය කිරීම (මු.රෙ.135)				
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ	අනුකූල වේ		

	ආයතනය තුළ දැනුම්වත් කර තිබීම			
3.3	සෑම ගනුදෙනුවක්ම නිළධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4. වාර්ෂික සැලසුම් සකස් කිරීම				
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම			
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5. විගණන විමසුම්				

5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, විගණන විමසුම වලට පිළිතුරු ලබාදීම	අනුකූල වේ		
6. අභ්‍යන්තර විගණනය				
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7. විගණන හා කළමනාකරණ කමිටු				
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන	අනුකූල නොවේ	දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්	

	තිබීම		පැවැත්වීමට තීරණය කර ඇත	
8. වත්කම් කළමනාකරණය				
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දි ගැනම් හා අපහරණය කිරිම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අපහරණ භාණ්ඩ ලැයිස්තුව සකස් කරගැනීමේ ප්‍රමාද වීම් හේතුවෙන් භාණ්ඩ අපහරණ කටයුතු සිදුකර නොමැත	ඉදිරියේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු නියමිත පරිදි කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරිම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල නොවේ	ගර්හිත භාණ්ඩ අපහරණය සඳහා කටයුතු කරමින් පවතී	

8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රේ.772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ	ගර්හිත භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා කටයුතු කරමින් පවතී	
9. වාහන කළමනාකරණය				
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරංශය වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලෝග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	වාහන ලෝග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	2021 වර්ෂයේ වාහන වල ඉන්ධන දහනය වීම පරීක්ෂා කිරීම කොවිඩ් 19 වසංගතය හේතුවෙන් කිරිමට නොහැකි විය	
9.6	කල් බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලෝග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූලවේ		
10. බැංකු ගිණුම් කළමනාකරණය				

10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	-		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11. ප්‍රතිපාදන උපයෝජනය				
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්				
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂකට වැඩ කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරිවුල් කර තිබීම	-		

13. පොදු තැන්පත් ගිණුම				
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 පුකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14. අග්‍රිම ගිණුම				
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15. ආදායම් ගිණුම				
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු	අනුකූල වේ		

	ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම			
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16. මානව සම්පත් කළමනාකරණය				
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල ඇතිවී ඇති පුරප්පාඩු හේතුවෙන් අත්‍යවශ්‍ය සේවාවන් ඉතා අසීරුවෙන් පවත්වාගෙන යාම	
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකාවන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17. මහජනයා වෙත තොරතුරු ලබාදීම				
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන	අනුකූල වේ		

	අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සපයා දී තිබීම			
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18. පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම				
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	සම්පාදනය කරමින් පවතී		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධික්ෂනය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කිරීම	අනුකූල නොවේ		ක්‍රමවේදයක් සකස් කරමින් පවතී
19. මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම				
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	මානව සම්පත් සැලැස්ම සකස් කිරීම සම්බන්ධයෙන් නිසි දැනුවත්භාවයක් නොමැති වීම	ඒ සඳහා පුහුණුවක් ලබාගැනීමට ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින ආපදා කළමණාකරණ

				අංශයෙන් ඉල්ලීම් කර ඇත
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සමාජිකයෙකු සහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		2021 වර්ෂයේදී මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට නියමිතය
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම පිළියෙළ කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම,නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කිරීම	අනුකූල වේ		
20. විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම				
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණල ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

D GM.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩීඑමඒ/ඒ/එමඊටී/02/21/09 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 මැයි 25 දින

අධ්‍යක්ෂ ජනරාල්

කාලඉඟණ විද්‍යා දෙපාර්තමේන්තුව

කාලඉඟණ විද්‍යා දෙපාර්තමේන්තුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එස්. එම්. එන්. නිලකරත්න
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත- 01.ලේකම්,රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
02. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

පිටුව 1 | 1

ඉල 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩී.එම්.ජී/ඒ/එම්ටී/02/21/09 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2021 මැයි 25 දින

අධ්‍යක්ෂ ජනරාල්

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව පසුව නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ

පාර 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය නිරණය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය නිරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙනයා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග අනුරූප වන බව මට ප්‍රකාශ කළ හැකිය.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර නිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය

1.6.1.1 අත්තිකාරම් ගෙවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මියගොස් ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 274,448 ක ණය ශේෂය 2022 අප්‍රේල් වනවිටත් අයකරගෙන නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ සේවය හැරගිය සේවකයෙකුගෙන් අයවිය යුතු රු.121,830ක්ද. සේවය හැරගොස් වර්ෂ පහකට වැඩි නිලධාරියෙකුගෙන් රු.3,000ක්ද වශයෙන් එකතු වටිනාකම රු. 124,830ක ණය ශේෂ අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් තුන්දෙනෙකුගෙන් රු.249,032ක ආපදා ණය ශේෂයක් අයකරගෙන නොතිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

දෙපාර්තමේන්තුව විසින් ගොන්ගල රේඩාර් පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා රු. මිලියන 402.8ක් වැය කර වර්ෂ 12ක් ගතවී තිබුණද එම කාර්යය මේ දක්වා ඉටුකර නොතිබුණි. තවද, අදාළ කාර්යය සඳහා රැගෙන එන ලද උපකරණ වලින් රු.මිලියන 9.1 ක් වටිනා උපකරණ අස්ථානගත වී තිබූ අතර ඉදිරිපත්කර තිබූ හානි හා පාඩු ලේඛනයේ එම වටිනාකම රු.මිලියන 4.9ක් ලෙස දක්වා තිබුණි. එමෙන්ම මෙම අස්ථානගතවීමට වගකිව යුතු නිලධාරීන්ද හඳුනාගෙන නොතිබුණි.

1.6.2.2 මූල්‍ය වත්කම්

නැමිපත්කරු හඳුනාගන නොහැකිව ලැබී තිබූ වටිනාකම රු.616,934ක්වූ චෙක්පත් 107ක් හඳුනාගෙන අදාළ ආදායම්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ) බැරකම් ලේඛනය	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකිවන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය.	පවත්වා නොතිබුණි.
(ආ) ස්ථාවර වත්කම් ලේඛනය	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගත යුතුය.	පවත්වා නොතිබුණි.

1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී අත්තිකාරම් මුදල් අයකිරීම් CIGAS ශේෂ පිරික්සුම අනුව රු. 9,492,823ක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවද, ගිණුම් ප්‍රකාශ - SASO අනුව රු.8,956,153ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව අත්තිකාරම් අයකිරීම් රු. 536,670ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල අත්තිකාරම් ගෙවීම් ලෙස CIGAS ශේෂ පිරික්සුම් අනුව රු. 8,092,249 ක් ගිණුම්ගත කළ යුතු වුවද, රු.7,555,579ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව අත්තිකාරම් ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 536,670ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සියලු ගැලපීම් කිරීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදනය රු. 395,100,000 ක් වූ අතර මුළු වියදම රු. 342,198,581ක් විය. එබැවින් ඉතිරිය රු. 52,901,419ක් නොහොත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 13.4ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

(ආ) මූලධන වැය විෂයයන් දෙකක් සඳහා වෙන් කරන ලද රු.මිලියන 12ක මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයන් සියයට 36 කද, ප්‍රාග්ධන වැය විෂයයන් 06කද සියයට 90 සිට සියයට 100 පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ඈ) ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිසි පරිදි ඇස්තමේන්තු නොකිරීම නිසා වැය විෂයයන් 05ක වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදන සියයට 5 සිට සියයට 100 දක්වා ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කිරීම් කර තිබුණි.

(ඉ) වැය විෂයයන් 06 කට වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදන සියයට 20 සිට සියයට 300 දක්වා ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ගෙන් මාරු කරගෙන තිබුණි.

(ඊ) මු.රෙ. 66 මඟින් ප්‍රතිපාදන සලසා ගත් වැය විෂයයක සියයට 7ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එලඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ ගෙවීම් වවුචර්පත් අනුව වැය විෂයයන් 05ක් සඳහා වූ බැරකම් රු.155,702ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) සම්මාදම් සහ දායක මුදල් යටතේ කලාපීය ඒකාබද්ධ බහුඋපදෘව පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය (RIMES), නිවර්තන සුලිසුළං පැනලය හා ෆයර්වෝල් දායකත්වය සඳහා ගෙවියයුතු දායක මුදල් සඳහා 2021 දෙසැම්බර් 31 දිනට ඉන්වොයිස්පත් නොලැබීම නිසා රු. 1,998,960ක බැඳීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 396 (ඇ)	සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිරිපත් කළ බැංකු සැසඳුමට අනුව එකතු වටිනාකම රු.87,398ක චෙක්පත් 08ක් නිකුත්කර මාස 06ක් ඉක්මවා ගෙවීමට ඉදිරිපත් කර නොතිබුණද, මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ii)	මුදල් රෙගුලාසි 565 (5)	එක් එක් මාසය සඳහා පොදු 71 ආකෘති පත්‍රයේ පිළියෙල කළ මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි.
(iii)	මුදල් රෙගුලාසි 570	ඉකුත් තැන්පත් පිළිබඳව සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ලැයිස්තු පිළියෙල කර නොතිබුණි.
(iv)	මුදල් රෙගුලාසි 571	අවුරුදු 02 ක් ඉක්මවූ රු.206,177ක තැන්පතු අවස්ථානෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.
(v)	මුදල් රෙගුලාසි 752	බඩු වට්ටෝරු පොතේ සෑම නිකුත් කිරීමක් සම්බන්ධයෙන්ම ඊට අදාළ නිකුත් නියෝගවල අංක සටහන් කිරීමට කටයුතු නොතිබුණි.
(vi)	මුදල් රෙගුලාසි 754	සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම බඩු වට්ටෝරු පොත තුලනය කර අතැති ශේෂය ඊළඟ මුදල් වර්ෂයට ඉදිරියට ගෙනයා යුතු වුවද, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය ගබඩාවේ බඩු වට්ටෝරු පොත පරීක්ෂාවේදී ඊට අනුගත වී මුදල් වර්ෂය අවසානයට පොත තුලනය කිරීමට කටයුතු කර නොතිබුණි.
(vii)	මුදල් රෙගුලාසි 1645	දෙපාර්තමේන්තුවේ වාහන 08ක් සම්බන්ධයෙන් ලොග් පොත් යාවත්කාලීන කර සම්පූර්ණ කර නොතිබුණි.
(viii)	මුදල් රෙගුලාසි 1647	වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ සම්පූර්ණ පරීක්ෂණයන් පැවැත්විය යුතු වුවත් දෙපාර්තමේන්තුව ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ) චක්‍රලේඛ

2016 දෙසැම්බර් 26 දිනැති 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 3.1 ඡේදය	සමාලෝචිත වර්ෂය තුල දෙපාර්තමේන්තුව සතු වාහන 08ක ඉන්ධන පරීක්ෂා කර නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

(i) 2.6.1 වගන්තිය	ප්‍රසම්පාදන කාර්යයන් සම්බන්ධයෙන් එකී ප්‍රසම්පාදන අයිතමයන්හි පිරිවිතර නාක්ෂණ කමිටුව විසින් සමාලෝචනය කිරීම හා අනුමත කිරීම නාක්ෂණ කමිටුවේ සෑම සාමාජිකයෙකුගේම වගකීම හා කාර්යය වුවත්, උපකරණ මිලදී ගැනීමේදී කාලගුණ විද්‍යා කමිටු සාමාජිකයන් ඊට අනුගතව ක්‍රියා කර නොනිබුණි.
(ii) 3.4.3 වගන්තිය	මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන අළුත්වැඩියා කිරීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට කටයුතු කර නොනිබුණි.

2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීමේදී ඇස්තමේන්තු ඉදිරිපත්කර ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් පමණක් නිකුත් කළ යුතු වුවත්, අවශ්‍යතාවය ඉක්මවා අවස්ථා 12කදී අත්තිකාරම් නිකුත් කර තිබූ අතර ලබා දී නිබුණු අග්‍රිමයෙන් සියයට 36 සිට සියයට 84 දක්වා වූ පරාසයකින් ඉතිරිවීම් සිදු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යය සාධනය

3.1.1 කාර්යය භාරයන් ඉටුනොකිරීම

(අ) දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලසුම්ට ඇතුළත්කර තිබූ හැකියා වර්ධනය, කාලගුණ විද්‍යා උපකරණ මිලට ගැනීම, ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම සහ ඩොප්ලර් රේඩාර් පද්ධතියේ කටයුතු යන කාර්යයන්වල ප්‍රගතිය සියයට 10කට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

(ආ) හැකියා වර්ධනය වෙනුවෙන් කාර්යය මණ්ඩල පුහුණුකිරීම් යටතේ වෙන්කල රු. මිලියන 6ක ප්‍රතිපාදනවලින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව, රු. මිලියන 3.5ක් ඉතිරි කර ඉතිරි රු.මිලියන 2.5න් රු. මිලියන 0.51 ක් පමණක් වැයකර තිබූ අතර සියයට 98ක ඉතිරිවීම් සිදුවී තිබුණි.

(ඇ) ඩොප්ලර් රේඩාර් පද්ධතියේ කටයුතු වෙනුවෙන් වෙන්කළ රු. මිලියන 12ක ප්‍රතිපාදනයෙන් කිසිදු වියදමක් දරා නොතිබුණි. 2021 වර්ෂයේ කාලගුණ විද්‍යා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු. මිලියන 11ක් ප්‍රතිපාදන වෙන්කර දී තිබුණද වැය කර තිබුණේ රු. මිලියන 0.95ක් වූ අතර කාලගුණ විද්‍යා උපකරණ ප්‍රසම්පාදනය අවලංගු කර තිබුණි. ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් යටතේ රු. මිලියන 0.5ක වියදම් දරා තිබුණු අතර ප්‍රතිපාදනයෙන් සියයට 91 ක් ඉතිරිවී තිබුණි. ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් රු. මිලියන 10ක ප්‍රතිපාදන සලසා දී තිබුණද රු. මිලියන 0.39 ක් වියදම් දරා තිබූ අතර ප්‍රතිපාදනයෙන් සියයට 96ක් ඉතිරි වී තිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

(අ) 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:2 (ඇ) ප්‍රකාර 2021 වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) ඉදිරිපත් කළ ප්‍රසම්පාදන සැලැසුමට අනුව පරිගණක මිලදීගැනීම වෙනුවෙන් රු. මිලියන 02ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, පරිගණක 14ක් මිලදී ගැනීම වෙනුවෙන් රු. මිලියන 3.89ක් වැයකර ඇස්තමේන්තුව ඉක්මවා වියදම් දරා තිබූ බැවින් ප්‍රසම්පාදන සැලසුමට අනුගතව කටයුතු කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෝටර් රථයක් 2021 පෙබරවාරි 15 සිට 2022 පෙබරවාරි 28 දිනය දක්වා කාලයක් ඌන උපයෝජිතව පැවතියද ඒ සඳහා වර්ෂය තුල රු. 492,779ක අළුත්වැඩියා වියදම් සිදුකර තිබුණි.

(ආ) 2021 වර්ෂයට අදාළව කාලගුණ විද්‍යා උපකරණ ප්‍රසම්පාදනය සඳහා රු. 38,231 ක පුවත්පත් දැන්වීමක් පලකර තිබුණද එම මිලට ගැනීම සිදුකර නොතිබුණු නිසා ඉහත පිරිවැය නිශ්කාර්ය පිරිවැයක් බවට පත්වී තිබුණි.

(ඇ) 2017 වර්ෂයේ හා ඊට පෙර වර්ෂවලදී සිට වාර්ෂික නොග සමීක්ෂණයේදී හඳුනාගත් යල්පැන ගිය හා විනාශ කල යුතු අබලි භාණ්ඩ අයිතම 135 ක් ඉවත් කිරීමට හෝ සුන්බුන් අගයට අලෙවිකර ආදායමක් උපයා ගැනීමට හෝ ක්‍රියා කර නොතිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන කරනු ලැබේ.

දිවයිනට බලපාන වැසි තත්ත්වය හා අනුබද්ධ කාලගුණ තත්ත්වය වඩාත් හොඳින් නිරීක්ෂණය කිරීමට සහ අයහපත් කාළගුණය පිළිබඳ පූර්ව අනතුරු ලබාදීමේ ක්‍රමවේදයට පිටුවහලක් ලබා දීමේ අරමුණින් ඩොප්ලර් රේඩාර් පද්ධතියක් පුන්නලම හා පොතුවිල් කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවල පිහිටුවීම් සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය විසින් ජපන් යෙන් මිලියන 2,503ක ප්‍රදානයක් ලබා දීම සඳහා 2017 ජූනි 30 ශ්‍රී ලංකා රජය සමඟ ගිවිසුමක් අත්සන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රජය මඟින් රු. මිලියන 486.6 මුදලක්ද දැරිය යුතු වන අතර, ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීමේ කාලය 2017-2021 දක්වා විය.

(අ) 2017 වර්ෂයේ සිට මේ දක්වා වසර 05ක කාලයක් ගත වී තිබුණද, මෙතෙක් ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොතිබුණි.

(ආ) 2021 වර්ෂයේදීද මේ සඳහා රු. මිලියන 12ක ප්‍රතිපාදන වෙන්කර දී තිබුණද, සමාලෝචිත වර්ෂයේදී කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඇ) පොතුවිල් රේඩාර් කුළුණ ඉදිකරනු ලබන කාළගුණ විද්‍යා මධ්‍යස්ථානය පිහිටි භූමියද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට මෙතෙක් පවරා ගෙන නොතිබුණි.

4 තිරසර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සැම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු අතර තිරසාර සංවර්ධන උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ දෙපාර්තමේන්තුව දැනුවත්ව සිටියද, යකසා අවසන් කිරීමත්, තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ලහාවීමේ ප්‍රගතිය,අධීක්ෂණය, පසු විපරම් සහ සමාලෝචනය වාර්තා කිරීමත් කර නොතිබුණි.

5 යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණක තනතුර 2013 වර්ෂයේ සිට 2019 ජූලි 01 දින දක්වා පුරප්පාඩුව පැවති අතර තනතුරට පත්කරනු ලැබූ නිලධාරිනිය 2020 අප්‍රේල් 17 දින ස්ථාන මාරු වී තිබූ අතර 2021 දෙසැම්බර් 31 දක්වා පුරප්පාඩුව පිරවීමට කටයුතුකර නොතිබුණි. 2021 වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණන වැඩ සටහනක් පිළියෙළ කර තිබුණද, අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 460ක් වූ අතර සත්‍ය සේවක සංඛ්‍යාව 355ක් වූයෙන් පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 105කි. වර්ෂ ගණනාවක සිට පුරප්පාඩු වී තිබූ තනතුරු 15ක්ම අත්‍යවශ්‍ය තනතුරු වන බැවින් ආයතනයේ අරමුණු හා කාර්යයන් නිසි ලෙස ඉටුකර ගැනීමට සැලකිය යුතු බලපෑමක් සිදුවී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සඳහා 2021 වර්ෂයට අදාලව මානව සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත හා 1988 අංක 74 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 91 දෙනෙකුගෙන් 53 දෙනෙකු විසින් වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) 2021 වර්ෂයේ නිලධාරීන් ලබාගත් වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයකිරීම් 2022 අප්‍රේල් 30 දින වන විටත් යාවත්කාලීන කර නොතිබුණි.

එස්. එම්. එන්. නිලකරුන්න
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට